
Discovery Series®

# උන්වහන්සේගේ ස්වරූපයට වෙනස් වීම



රෙජිනා ෆ්‍රෑන්ක්ලීන්



## හැඳින්වීම


# උන්වහන්සේගේ ස්වරූපයට වෙනස් වීම

“කාන්තාව + සුන්දරත්වය” පිළිබඳ ක්ෂණික අන්තර්ජාල සොයා බැලීමක ප්‍රතිඵලය වූයේ මිලියන දෙකකට ආසන්න සංඛ්‍යාවක් එයට ඇතුලු වීමය! ශාරීරික සුන්දරත්වය ජීවිතයේ වඩාත්ම වැදගත් දෙය බව සඟරා පිට කවර, දැන්වීම් පුවරු, වෙළඳ සංකීර්ණ හා රූපවාහිනී දැන්වීම් ලොවට හඬගා කියන්නේය. අපද ඒවා විශ්වාස කරන්නෙමු! අලුත් නිෂ්පාදනයන් අපව හැඩ කරන බවට, සිහින් සිරුරක් ලබා දෙන බවට හෝ අලුත් පුද්ගලයන් බවට පත්කරන පොරොන්දු යන කාරණා සියල්ල ඒවා අත්හදා බැලීමේ පරීක්ෂාව කරා අප ගෙන යන්නේය. පුරුෂයින් මෙයින් බැහැර නොවේ. නවීන විලාසිතාවෙන් යුත් ඇඳුම් මිළදී ගැනීම, නවීනතම ව්‍යායාම් වැඩ සටහන් අත්හදා බැලීම, ගැළපෙන මෝස්තර අනුගමනය කිරීම වැනි දේවල් කෙනෙකුගේ සිරුරේ මිම්මට වඩාත් වැදගත් වන කායික පෙනුම බව විශ්වාස කරන්නාවූ මිථ්‍යා මතය ඔවුන්ද වැළඳගෙන සිටිති. කෙනෙකු පහසුවෙන් පොළඹවන සුළු මෙම බොරුව ඔවුන්ගේ ස්වයං හැඳින ගැනීම දූෂ්‍ය කරනවා පමණක් නොව කාන්තාවන් පිළිබඳ ඔවුන්ගේ මතයද දූෂ්‍ය කරන්නේය.

ලේඛිකා රෙජිනා ෆ්‍රැන්ක්ලින්, අපට දෙවියන්වහන්-සේගේ දෑසින් අප දෙස බලන ලෙසත්, අපගේ දුබල

ආත්ම ප්‍රතිබිම්බය යළි ප්‍රතිෂ්ඨාපනය කිරීමට උන්වහන් සේට දැඩි සේ අවශ්‍ය බව දැනගන්නටත් උදක්ම අපගෙන් ඉල්ලා සිටින්නේය එහෙත් ඒ, හාස්කම් කරන ආලේපන වර්ගවලින්, ශාරීරික අභ්‍යාස කරන්නාවූ ස්ථානවල සාමාජිකත්වය ලබා ගැනීමෙන් හෝ උදරය නෙරා ඒම වළක්වන බඳ පටිවලින් හෝ නවීන මෝස්තර සැළසුම් අනුගමණය කිරීමෙන් හෝ නොවේ. නුමුත් අප කෙරෙහි ඇති දෙවියන් වහන්සේගේ කොන්දේසි විරහිත ප්‍රේමය තුළින්ය. ඇය අලුත් වඩාත් යහපත් සැබෑ සුන්දරත්වයක් නිර්වචනය කිරීම වෙත ගමන් කිරීමට අපට ආයාචනා කරන්නේය "දෙවියන්වහන්සේ මා දෙස බලන ආකා-රයෙන් මම මා දෙස බැලීමට තෝරාගත යුතුය. සුන්ද රත්වය පිළිබඳ ලෝකයේ නිර්වචනය පසෙකින් තැබීම මම තෝරා ගත යුතු වෙමි. මගේ හිසකෙස් නියමාකාරයට සැකසී ඇත්දැයි බලනු වෙනුවට මගේ හදවත නියම ස්ථානයේ තිබේදැයි මම පරීක්‍ෂා කර බැලිය යුතු වෙමි. මගේ ඇඳුමට මගේ ආභරණ නොගැළපීම ගැන කනස්සලුවනු වෙනුවට මම විශ්වාස කරන දේ සමග මගේ ආකල්ප ගැළපේදැයි සිතා බැලිය යුතු වන්නේය. සෙසු අය මගේ ශාරීරික සුන්දරත්වය දකින්නේදැයි සිතා බලමින් නොසිට ක්‍රිස්තුස් වහන්සේගේ ආත්මික සුන්දරත්වය ඔවුන් මා තුළින් දකින්නේදැයි ඉලක්ක කොට ගන්නෙමි". නුමුත් මෙම ක්‍රියාදාමය පහසු එකක් නොවන්නේය.

රෙජිනාගේ මෙම අවංක ආකල්ප ගැහැණු පිරිමි, තරුණ මහලු අප සියලු දෙනා හට ප්‍රඥාව බෙදා දෙන් නේය. අප එකිනෙකා තුළ දෙවියන්වහන්සේ තබා ඇති අමිල වස්තුව වටහා ගැනීමට හා අගය කිරීමට අප ගමන් කරන මෙම ගමනේදී ඇය හා අත්වැල් බැඳ ගැනීමෙන් අප ධෛර්යමත් වනු ඇති බව මගේ අපේක්‍ෂාවයි.




කැරල් හෝල්ක්විස්ට්
සංස්කාරක ඩිස්කවරි හවුස් පබ්ලිෂර්ස්

# අන්තර්ගතය

එක

හඬ නොමැතිව ....................................5

දෙක

ඇතුළාන්තයේ කට හඬවල්....................11

තුන

නව දෘෂ්ටිකෝණයක්............................. 27

Translator : Chrishanthi Perera
Editor : Kanthie Wijeyesekera
Cover Photo and Design: Terry Bidgood
Interior Design: Steve Gier
Interior Images: From Stock.xchng: (p.5) Irena Laskowska; (p.11) Edmonto Dantes;
(p25) John Benetti

උපුටාගත් බයිබල් පාඨ: © ශ්‍රී ලංකා බයිබල් සමාගම, 1995 සංශෝධිත පැර අනුවාදය.

All rights reserved
©2012, 2017 Our Daily Bread Ministries
Printed in Sri Lanka



එක

# හඬ නොමැතිව

**මගේ පියා නැති අඩුව මට තදින් දැනෙනවා** යයි පැවසීම මුහුදු ජලය ස්වල්ප වශයෙන් ලුණු රසයි යනුවෙන් පැවසීම හා සමානය. පනස් එක්වන ජන්ම දිනය සැමරීමට මඳ කාලයකට පෙර ඔහු පිළිකා රෝගයෙන් මිය ගියේය. කිසිවක් නොමැතිව යමක් නිර්මාණය කිරීමට ඔහු දැන සිටියේය. ලිඛිත සංගීතයේ හා ප්‍රබන්ධයේ ඔහුගේ ආචාර්ය (පීඑච්ඩි) උපාධිය සම්පූර්ණ කිරීම සඳහා නිවස පිටුපසට වී ගී ගයමින් මගේ පියා සරළ අත්දැකීම් රැගෙන ඒවා මහත් දේ බවට පරිවර්තනය කළේය.

හද්දා පිටිසර කුඩා නගරයක දකුණු දෙසෙහි දේශකයෙකුගේ බාල පුත්‍රයාවූ මගේ පියා තරුණයෙකුව සිටියදී පවා තමාගේ සිහින ඇත්තේ උතුරු කැරොලිනාවේ වැන්සිබෝරෝහි සීමාවෙන් එපිට බව දැන සිටියේය. ලෝකය දකින්නට අවශ්‍ය වූ විට බොහෝ තරුණයින් ගන්නා පියවර ඔහුද තැබුවේය. ඔහු හමුදාවට බැඳුණේය.

නිවස අතහැර යන අවස්ථාවේ දෙවියන්වහන්සේ වෙතින් පලා යමින් වැන්සිබොරෝවෙන් පිටතදී පවා දෙවියන්වහන්සේට ඔහුව සොයා ගැනීමට හැකි බව ඉක්මණින් ඔහු තේරුම් ගත්තේය. ඔහු තම දැඩි ආශාව තේරුම් ගෙන දෙවියන් වහන්සේගේ සේවයට කැඳවීමට අවනත වූයේය. ඊළඟ වසර 31 ඔහු ගත කලේ ඔහුගේ මහා ප්‍රේමයන් වූ දෙවියන්වහන්සේ, පවුල, සංගීතය හා

අධ්‍යාපනය යන කෙඳිවලින් විචිත්‍ර ගෙත්තමක් වියමින්ය.

මගේ පියාගේ මරණින් ඇතිවූ හිඩස පිරවීමට පුළුවන්වන්නේ දෙවියන්වහන්සේට පමණය. නුමුත් ඔහුගේ අභිමිවීම පිළිබඳ කනස්සලු වෙමින් සිටියදී උන්වහන්සේගේ ජීවිතය නැමති දීමනාව පිළිබඳ දෙවියන්වහන්සේ මට සිහිපත්කරවූ සේක. දෙවියන්වහන්සේගේ අපූර්වත්වය හා ඉගෙන ගැනීමේ අපූර්වත්වය යන මෙම කාරණා දෙකම එනම් දෙවියන්වහන්සේට ප්‍රේම කිරීම යනු උන්වහන්සේ පිළිබඳව වැඩියෙන් දැන ගැනීමට ආශාවීම හා එකට බැඳී ඇති බව උන්වහන්සේ මට ඉගැන්වූ සේක.



කෙසේ වෙතත් මගේ පියා ලබාගත් බොහෝ දේ තිබියදී ඔහු තම ශාරීරික පෙනීම විශේෂයෙන් ඔහුගේ බර පිළිබඳව නිතරම ඉච්ඡාභංගත්වයට පත්ව සිටියේය. සාර්ථක මනුෂ්‍යයෙකු පිළිබඳ සමාජීය ශාරීරික ස්වරූපය ඔහු දුටු අතර, මෙම ප්‍රමිතියට ඔහුගේ සිරුර හැඩගැසීමට ඉඩ හැරියේය. ඒ හේතුව කරණකොටගෙන සත්‍ය වශයෙන්ම ඔහු වටිනා කෙනෙකු කරනු ලැබුවේ කුමක්ද යන්න පිළිබඳව ඔහු අන්ධව සිටියේය. මගේ පියා කුසලතා පිරි සංගීතඥයෙකු, දක්ෂ ගුරුවරයෙකු, විශ්වාසවන්ත පුද්ගලයෙකු වූ අතර, තමා සහජයෙන් ලද වටිනාකම අවබෝධ කර ගැනීමට අරගලයක යෙදුණේය.

මගේ පියා ඉඳහිට කථාකළ කෙනෙකුවූ නුමුත් ඔහු සේවකයකු බව පෙනෙන්නට නොතිබුණු බව "හඬක් නොමැති" හඬක් පවසනු ඔහුට ඇසුණේය. ප්‍රධාන පාලකවරු, සාර්ථක බව පෙන්නුම් කරන මනුෂ්‍යයින් අගය කරනු දකින විට හා කුලී පදනම මත පත්කළ කම්වු සාමාජිකයින් සුදුසුකම් මතට වඩා ශාරීරික පෙනුම පදනම්කොට ගෙන කාර්යාල සේවකයින් තෝරා ගන්නා බව බලා සිටින විට මගේ පියාට ඒ නිහඬ පණිවුඩය වඩා උස් හඬින් හා පැහැදිළි ලෙස ඇසෙන්නට විය. මනුෂ්‍යයෙකුගේ ස්වරූපය දේශනා කූඩුව පිටුපසදී ඔහුගේ අගය පෙන්වා දෙන්නේය.

මගේ පියාගේ අව්‍යාජ බව මනුෂ්‍යයින් ඔහු වෙතට ඇදගත් නුමුත් තමා වෙනස් කෙනෙකු වීම මනුෂ්‍යයින් අපේක්ෂා කළ බව සිතමින් ඔහු

**තමන් පිළිබඳ සෘණාත්මක අදහස් මගේ පියාගේ කථාව තුළින් විනිවිදව දක්නට ලැබුණු අතර මමද එම ආත්ම ඇගයීමේ අපහාසාත්මක බව ඉගෙන ගත්තෙමි.**

තමන් ගැන අවතක්සේරු කළේය.
සුළු වශයෙන් දක්නට ලැබුණු ඔහුගේ එක් අසංසන්දනයක් වූයේ ලබාගැනීම හා ආත්මාභිමානය අතර පැවති සම්බන්ධතාව පිළිබඳව මා හට පැවසූ දේවල් ඔහු ජීවිතය තුළින් ඉතා විරළව පෙන්නුම් කිරීමය. ඔහු මගෙන් අපේක්ෂා කළ එකම දෙය වූයේ මගේ උපරිමයෙන් යහපත් දේ කිරීමය. මගේ දුර්වලතා තිබියදී පවා දෙවියන්වහන්සේ මහත් ක්‍රියා කරනු ඇත. කෙසේ වෙතත් තමා පිළිබඳ මෙම න්‍යාය මගේ පියාගේ දෘෂ්ඨි කෝණය තුළ පරාවර්තනය වනු මම නුදුටුවෙමි.

තමා පිළිබඳ සෘණාත්මක අදහස් මගේ පියාගේ කථාව තුළින් විනිවිද පෙන්නුම් කළේය. මමද එයම ඉගෙන ගත්තෙමි. මම වඩා අගය කළ පුද්ගලයා තමා නොපිළිගන්නා කෙනෙකු බව පිළිගන්නා විට මගේ බාහිර පෙනුම හා සාර්ථකත්වය පිළිගන්නා බව මම සිතන්නේ කෙසේද?

මගේ පියාගේ දෛනික වාග් මාලාවේ කොටසක්වූ "ඩයට්" (විශේෂ ආහාරවලට සීමාවීම) යන වචනය සමග මා හැදී වැඩුණේ යෝගට්, සිදරන් හා සලාද සාර්ථකව බර

ශක්තිමත් හා යටහත් ආත්මවල වටිනාකම පිළිබඳ පැහැදිළි උදාහරණයක් පිලිප්පි 2:5-11 දක්වා කොටසින් අපට ඉදිරිපත් කර ඇත යේසුස් වහන්සේ තමන් සිටි තත්ත්වයට වඩා අඩුවෙන් හෝ වැඩියෙන් හෝ තමන් ගැන නොසිතු සේක. නිසි ආත්මාභිමානය ගලා එන්නේ ක්‍රිස්තුස්වහන්සේගේ සිත ඇතිව සිටීමෙන්ය.

අඩුකර ගැනීමේ ඕනෑම වැඩ සටහනක ආහාර බව සිතමින්ය. සෑම නව විශේෂ ආහාරවලට සීමාවීමේ වැඩසටහනකදීම ඊට ගැළපෙන ව්‍යායාම් රටාවක් තිබුණේය. මගේ පියාගේ විශේෂ ආහාර ගැනීමට හා ව්‍යායාම් වැඩසටහන් වලට වඩා දිගු කාලයක් පැවතියේ බර අඩුකර ගැනීමට ඔහු තුළ වූ දැඩි ආශාවයි.

මගේ දෙමාපියන් අතරවූ සම්බන්ධතාවයේ ගැටළුකාරී බවක් මේ අතර මම නිරීක්ෂණය කළෙමි. මගේ මව ශීතකරණයේ ආරක්ෂකයා මෙන්ම ඔහුගේ ආහාර පාලනයේ ආරක්ෂකයාද වීම මගේ පියා අපේක්ෂා කළේය. මමද මගේ බර අඩුකර ගැනීමේ බර දැරීමට මගේ බර අඩුකර ගැනීමට මට උපකාර කරන එපමණක්ද නොව මම තරබාරු බව දැණුනු විට මගෙන් දොස් ඇසීමටද කෙනෙකු සොයමින් සිටියෙමි.



දිනක් මගේ දෙමව්පියන් කෑම මේසයේ සාකච්ඡා කරමින් සිටියදී මම අධිෂ්ඨානශීලීව එහි ඇතුලුවී අර්තාපල් පෙති කීයක් මම කනවාදැයි බලා සිටින්න යයි ඔවුන්ට කීවෙමි. මගේ බර වැඩිවී හෝ ආහාර ගැනීමේ පුරුදු වැඩිවී තිබුණේ හෝ නැත. මම අවලක්ෂණ බව හා කිසිවකු මට ආදරය නොකරන බව මට හැඟි ගොස් තිබුණි. අභ්‍යන්තරයට මා විසින් ආදරය කරන පිණිස මගේ බාහිර දැක්ම වෙනස්කර ගැනීමට උපකාර කරන කෙනෙකු මට අවශ්‍ය විය.

බුද්ධිමත් ලෙස මගේ දෙමව්පියන් එය ප්‍රතික්ෂේප කළෝය. ඔවුන් මට උපකාර නොකළහොත් මම ආහාර ගැනීම පාලනය කිරීමට නොහැකි වනු හෝ ආහාර අරුචියෙන් පෙළීමට ඉඩ ඇති බව හඬමින් පැවසුවෙමි. මගේ පියා මෙන් මා සිතුවේද මම ගන්නා ආහාර පාලනය කළහොත් මට අවශ්‍ය පරිදි ශරීරය සකස්කර ගත හැකි බවත් මම ආශා කරන ලද පමණින් සතුටු වීමේ හැඟීම ඇතිකර ගැනීමට හැකිවන බවත්ය. මගේ පියාට මෙන්ම මටද නියම කාරණය මඟහැරී තිබුණි.

ආත්ම ප්‍රතිබිම්බය පිලිබඳ සත්‍යය මා වටහා ගැනීමට පෙර මගේ පියා මියගිය නමුත් ඔහුගේ ආත්ම දෘෂ්ඨි කෝණයන් මා හට දැඩි ලෙස බලපෑ අන්දම දැනගත්තේ නම් ඔහු දැඩි

ලෙස ශෝකවනු ඇත. ඔහුගේ හැසිරීම ඔහුට පමණක් බලපෑ බව ඔහු සිතුවේය. නුමුත් කෙනෙකුගේ කම්මුල් දිගේ ගලන කඳුළු කථාව වාතාවරණයක් නිර්මාණය කරන්නේය. එහි ඇතුලුවන සියල්ලන් හට එහි බලපෑම හැඟෙන්නේය.

කිසිවක් නොමැතිව ඔබට ඇසෙන කටහඬවල් මොනවාද? ඔබ වැඩුණු පසුව ඔබගේ දෙසවන තුළ රැව්දෙන ළමා කාලයේ

**අපගේ ආත්මාභිමානය අපගේ ආත්මය තුළ මුල් බැස ඇත. ක්‍රිස්තුස්වහන්සේ තුළ අප කවුරුන්ද යන්න දැන අප තුළ ඇති දැඩි ආශාවට අපගේ කායික පැවැත්ම යළි සාදා ගැනීමට ගන්නා වෑයම තුළින් පිළිතුරු සැපයිය හැකි නොවේ.**

මිතුරන් පැවසූ ඇනුම්පද? ඔබට කිසි දිනෙක සතුටු කිරීමට නොහැකිවූ මව හෝ පියා? ඔබ ආකර්ෂණීය බව ඉඳ හිට පවසන හා ඔබගේ හදවතෙහි බිත්තිවල දෝංකාර දෙන ඔබගේ සහකරුවාගේ හෝ සහකාරියගේ නිහඬභාවය?

අපි කටහඬවල් ඇසීමෙන් ඒවා නිහඬ කිරීමේ ක්‍රම සොයන්නෙමු. ක්‍රියා කරන්නාවූ ආහාර පාලනය, නිසි ව්‍යායාම් වැඩසටහන් පූර්ණ පරිවර්තනයක් කරන්නේය. එසේ නමුත් කටහඬවල් එසේම පවතින්නේය. අප පිළිබඳ සත්‍යය නොඇසෙන පරිදි ඇතැම්විට ඒවා ඉතා ඝෝෂාකාරී ලෙස ඇසෙන්නේය.

අපගේ ආත්මාභිමානය අපගේ ආත්මය තුල මුල් බැස ඇති බැවින් අප ක්‍රිස්තුස්වහන්සේ තුළ කවුරුන්ද යන්න දැන ගැනීමට ඇති

සෙසු අයගේ අනුමැතිය තුළ අර්ථය සෙවීමට උත්සාහ කිරීම මගින් එම අපේක්ෂාවන් සම්පූර්ණ නොවන බැවින් කළකිරීම ගෙන එන්නේය

ආශාවන් අපගේ ශරීර නැවත සාදාගැනීමට
ගන්නා උත්සාහය තුළින් පිළිතුරු නොලබන්නේය.

මෙවැනි ලුහුබැඳ යාමක් කටහඬවල් නිහඬ නොකරන අතර අපගේ ආත්මික උවමනාවන්ටද පිළිතුරු නොදෙන්නේය. අවසානයේදී හිස් හඬවල් ඇතුළාන්තයේ කට හඬවල් සමග එක් වන්නේය.



දෙක

# ඇතුළාන්තයේ කට හඬවල්

**දවසේ ඕනෑම වේලාවක්** තෝරා ගන්න. ඔබගේ දෙසවන් තුළ ලෝකයේ ඝෝෂාකාරී බව රැව් දෙනු ඔබට ඇසෙන්නේය. අපට සිතන්ට හැකිවීම සහ දෙවියන් වහන්සේගේ හඬ අඩු වශයෙන් ඇසීම පුදුමය.

ඊළඟට ඇත්තේ අප හුදකලාවී සිටින මොහොතේදී පවා අප අරගල කරන කඩහඬවල්ය. සෑමදෙනා හටම මේවා ඇසේ. නුමුත් ඒවා නිහඬ කිරීමට බොහෝ දෙනා අසමත් වෙති. ඇතුළාන්තයේ කටහඬෙහි බලය හඳුනා ගත් ලේඛකයකු වන නිකොල් ජොන්සන් සිය 'අ ෆ්‍රෙෂ් බෘව්ඩ් ලයිෆ්' නම් කෘතියෙහි මෙසේ ලියා ඇත. "මෙම කටහඬවල් අපව බිම් මහලේ යදම්වලින් බැඳ තබා ඇත. අලුත් යමක් අත්හදා බැලීමට අපට බිය ඇති කරන්නේය. අන්‍යයන් අප ගැන සිතන්නේ මොනවාද යන්න ගැන කුතුහලය ඇති කරයි. ඒවා අපට ඉදිරිපත් කිරීමේ ඒකාකාරී තත්ත්වයක තබා තිබේ".

අප මෙවැනි පණිවිඩවලට සවන් දී දීර්ඝ කාලයක් ඒවාට කීකරුවීම නිසා, නොසෑහෙන බව, අසමත් බව, අශෝභනකම වැනි වචන අපගේ හදවත් තුළ මුල්බැස ගෙන අප සමග ජීවත්වන වචන බවට පත්ව ඇත. අප දන්නා සත්‍යයට වඩා ඒවා අප හොඳින් දන්නා බොරු වන්නේය.

මෙම ලෝකයෙන් ඔබ්බට ඇති සුන්දරත්වය දකින්නට අපට

කරදර කරන්නාවූ ආශාවක් දැනෙන විට, අප තුළ තවත් දැඩි පීඩනයක් ඇති නොවන පිණිස ඉක්මණින් ඒවා මැඩ පවත්වා ගන්නෙමු. එයින් සිදු වන්නේ අපට අයිති දේවල් පිළිබඳ සැබෑ ආශාවන් හරයක් නොමැති ආවරණයකින් වැසී යාමය.

මා හටම ප්‍රේම කිරීමට හා මම සුන්දර බව දකින්නට කළ අරගලය තනිව කළ එකක් බව වසර ගණනාවක් පුරා මම සිතා සිටියෙමි. මගේ මිතුරන් සමග බොහෝ රහස් බෙදා ගත්තෙමි. නුමුත් මා හට දැනුණු ප්‍රබල අදක්ෂ බව බෙදා නොගත්තෙමි. දෙවියන් වහන්සේ සහ අපගේ පවුල් කෙරෙහි ඇති අපගේ ප්‍රේමය ගැන කථා කළෙමු. නුමුත් අපටම ප්‍රේම කිරීමට ඉගෙන ගැනීමට ඇති බිය පිළිබඳව කථා නොකළෙමු.

පසුගිය වසර ගණනාවක් පුරා මම අන් අයගේ හඬවල්වලට වඩා හොඳින් සවන් දුන්නෙමි. මම අරගල කරන්නේ තනිව නොවන බව එවිට මම දැනගත්තෙමි.



මම වයසින් වැඩෙත්ම මා ගැන මට හැඟුණු දැඩි අතෘප්තිකර බව ස්වල්ප දෙනෙකු දැන සිටියේය. මම සැම විටම මා ගැන ආත්ම විශ්වාසයක් ඇති තරුණියක් බව පෙන්නුම් කළෙමි. අප්‍රසන්න හැඟීම්, ක්‍රියාකාරකම් හා සම්පූර්ණකර ගැනීම් රාශියකින් මා වසා ගැනීමට මම ඉගෙන ගත්තෙමි. මගේ ආවේණික අගය අවබෝධ කර ගැනීමට මට හැකියාවක් නොවීය. එබැවින් සමාජශාලා ක්‍රියාකාරකම් හා අධ්‍යයන ලබා ගැනීම් සමූහයක් තුළ මම අගයන් ලැයිස්තුවක් නිර්මාණය කළෙමි. මම කිසි දිනෙක ශෝභන නොවන බව හඬවල් මට පවසන අවස්ථාවේ ඔවුන්ගේ චෝදනා ක්‍රම වලට මම මගේ ජයග්‍රහණ ලබාගැනීමේ ක්‍රමයෙන් පිළිතුරු දුන්නෙමි. ඊට හේතුවූයේ මා කළ දේවල් මම කව්ද යන්න තුළින් වෙන්කර ගැනීමට මට නොහැකි වීමය. මා කරන්නාවූ දේවලින් අසමත්වීම යනු මම කව්ද යන්නෙන් අසමත් වීමය.

උසස් අධ්‍යාපනයෙන් උපාධිය ලැබූ පසු මම වැඩිදුර අධ්‍යාපනය ලැබීමට නිවසින් පිටව ගියෙමි. මගේ හුරුපුරුදු එහෙත් හිතවත් නොවන හඬවල් දමා යන්නට මට දැඩි ආශාවක්

තිබුණද ඒවාද මා සමග ගමන් කළේය.

උසස් විද්‍යාලයේ සිටියදී සෑම ගෙදරවැඩ පැවරුමක්, ප්‍රහේලිකාවක්, පරීක්ෂණයක් හා ප්‍රශ්න පත්‍රයක් සමගම පසු විපරමක් කිරීමට මට සිදුවිය. එහෙත් උසස් අධ්‍යාපනය ලබද්දී ගෙදරවැඩ පැවරුම් වලට බොහෝ දේ කියවීමට සිදුවිය. තේරුම් ගැනීමට නොහැකි තරම් ප්‍රහේලිකා පැටලිලි සහිත ඒවා විය. විභාග හා ප්‍රශ්න පත්‍ර සමස්ථ අධ්‍යයන වාරය පුරා ඉගැන්වූ කාරණා පදනම් කොට සකස්කළ ඒවා විය. ඇතැම් අවස්ථාවල ඒවා ආපසු ශිෂ්‍යයන්ට ලබා දෙනු ලැබුවේ නැත.

**මෙම පණිවුඩවලට අප කෙතරම් දිගු කාලයක් සවන් දුන්නේද යත් හා ඒවාට කීකරු වූයේ කෙතරම්ද යත් ඒවා අපගේ හදවත් තුළ මුල් බැස ඇති අතර අප ජීවත් කරන්නාවූ වචන බවට පත්ව ඇත.**

මගේ දරා සිටීමේ හැකියාව සොයා ගැනීමේ අරගලයක මම යෙදී සිටියෙමි. මගේ ශ්‍රේණිය මට වැදගත්වූ බව මම දැන සිටියෙමි. එහෙත් ඒවා කෙතරම් වැදගත්ද යන්න මම වටහා ගත්තේ ඒවා මිණුම් දණ්ඩක් ලෙස භාවිතා කිරීමට තවදුරටත් නොතිබුණු අවස්ථාවේය. මම කවුරුන්ද යන්න පිළිබඳව එකතුවක් බවට මගේ ශ්‍රේණිගතවීම් හා ජයග්‍රහණ පත්කොට ගෙන තිබුනි. මෙම සත්‍යයට අවධානය යොමු කරනු වෙනුවට ඒවා නිහඬ කිරීමට දැඩි පරිශ්‍රමයක යෙදුණෙමි.

අන් කිසි දිනකටත් වඩා ක්‍රියාකාරකම් වැදගත් බවට පත්විය. මම සමාජ ශාලාවලට

සම්බන්ධ වූයෙමි. විශ්ව විද්‍යාල නායකත්වය උදෙසා තරඟ කළෙමි. නමුත් හඬවල් නිරන්තරයෙන් මා සමග විය. දිගින් දිගටම ඒවායේ බලපෑම් මර්දනය කිරීමට මම ආහාරයට ගන්නේ මොනවාද හා ව්‍යායාම් කළේ කවදාද යන්න පිළිබඳව සිතා බලන්නට කාලය යෙදවූයෙමි. මෙම හඹා යෑම් නිවැරදි වූවත් මගේ අභිප්‍රාය වැරදි විය. මම කවුරුන්ද යන්න පිළිබඳව අසතුටට පත්ව සිටිමින්, දෙවියන්වහන්සේගෙන් බැහැර දේ තුළින් මගේ වටිනාකම සෙව්වෙමි. මාගේ ක්‍රියාවන් දෙවියන්වහන්සේට වඩා අන්‍යයන් සතුටු කිරීම උදෙසා පෙළඹවීමක් ඇති කළේය.

සංක්‍රමණික දේ තුළ අර්ථය වටහා ගැනීම මගින් සමාජයේ හඬවල් නිහඬ කිරීමට අප දැඩි වෑයමක් දරන විට, අපට වටිනාකමක් නොමැති බව සමාජයේ හඬවල් වඩාත් ශබ්දයකින් හඬගාන්නේය. දෙවියන්වහන්සේ තුළ වටිනාකම සොයා බැලිය යුතු බව මම දැන සිටියෙමි. මගේ අභ්‍යන්තර අරගල මැද වුවද දෙවියන්වහන්සේ පිළිබඳව වැඩියෙන් දැන ගැනීමට ඇති දැඩි ආශාව හා අන්‍යයන්ගේ අනුමැතිය ලබා ගැනීමට ඇති දැඩි ආශාව අතර පැවති පීඩනය අතර අරගල කිරීමට මට සිදුවිය.

ඊටත් වඩා වැදගත් වන්නේ මා පිළිබඳ දෙවියන්වහන්සේ සිතූ ආකාරය මම මා ගැන සිතන ආකාරයට මාරු කිරීමේදී මුහුණ පෑ දුෂ්කරතාවයයි. දෙවියන්වහන්සේ යෙරෙමියා තුළින් ඉශ්‍රායෙල් සෙනඟට කථා කළ වචන තුළ මා උදෙසාද සත්‍යය ගැබ්වී ඇති බව දැන සිටි නිසා මම ඒ වචන ග්‍රහණය කොට ගතිමි. "මා විසින් නුඹලා ගැන කරන යෝජනා මමම දනිමි. නුඹලාට මතු කාලයේදී බලාපොරොත්තුවක් දීමට ඒවා විපත්තියේ නොව සමාදානයේ යෝජනා යයි ස්වාමින්වහන්සේ කියන සේක. නුඹලා මට අඬගසන්නහුය. ගොස් මට යාච්ඤා කරන්නහුය. මමද නුඹලාට ඇහුම්කන් දෙන්නෙමි. නුඹලා මා සොයනවා ඇත නුඹලා මුළු සිතින් මා සොයන කල මා නුඹලාට සම්බවෙනවා ඇත" (29:11-13).

මගේ ජීවිතය උදෙසා දෙවියන්වහන්සේගේ කැමැත්ත මට අවශ්‍ය විය. උන්වහන්සේ මා මැවූ ආකාරයටම මා පිළි ගැනීම

හා මගෙන් බැහැරව සමාදානය සෙවීම අතහැර දැමීම උන්වහන්සේගේ සැළැස්මට අන්තර්ගත බව මට කිසිසේත්ම තේරුම් ගියේ නැත. මගේ බාහිර පෙනුම පිළිබඳව විශ්වාසයත්, සාර්ථකත්වය පිළිබඳ සහතිකයත්, අන්‍යයන්ගේ අනුමැතියත් ලබාගත් විට මගේ ජීවිතය උදෙසා වන දෙවියන්වහන්සේගේ කැමැත්ත දැනගත හැකි බව සිතුවෙමි.

ආශාව තිබියදීම ක්‍රියාකාරකම් මගෙන් ඉවත්වූ පසු, මගේ ජීවන සහකරුවා එනම් මාගේ අනාගතය බෙදා ගැනීමට දෙවියන්වහන්සේ විසින් තෝරා ඇති පුද්ගලයා මුණගැසුනු පසු මම ආශාවෙන් බලා සිටි සමාදානය සහ ආත්මික ප්‍රේමය මට සම්බවනු ඇතැයි මම සිතුවෙමි. කෙනෙකු මා හට ප්‍රේම කිරීම හා මා පසුපස සිටීම මට කිසියම් වටිනාකමක් ඇති බව සනාථ කරනු ඇත. ඇත්ත වශයෙන්ම එවිට මා පිළිබඳ ඇති දෙවියන්වහන්සේගේ සිතිවිලි හා හැඟීම්වල ගැඹුර මා තේරුම් ගන්නවා ඇත.

බොහෝ විට අපි කරන දෙයින් අපි කව්දැයි අපි වරදවා වටහා ගන්නෙමු. ක්‍රියාවන් සහ අනන්‍යතාවය වෙන් වෙන්ව පවත්නා අදහස් දෙකකි.

සෑම යෞවනියක්ම දිලිසෙන වස්ත්‍රවලින් සැරසුණු ඇගේ නයිට්වරයා මුණගැසෙන දිනය ගැන සිහින මවන්නීය. ඕනෑම කාලයකට ගැළපෙන ප්‍රේම ප්‍රබන්ධයක් වන Anne of Green Gables නිතර කියවූ මා හට මගේ ගිල්බර්ට් වන පුරුෂයා ගැන බලාපොරොත්තු තබාගැනීමට කිසිදු දිරිගැන්වීමක් අවශ්‍ය නොවීය. පාසැල් වියේ ප්‍රේම සම්බන්ධතා අපගේ සිහින හා අනාගතය පිළිබඳ අපගේ අවශ්‍යතා සළකන්නේය. නුමුත් එය අන්තයට ගියහොත් එය රවටන සුලුවන්නේය. පාසැල් යන වයසේ යුවතියකගේ දෘෂ්ඨි කෝණයෙන් බලන කල කථාව නිම වන්නේ තරුණිය

නයිට්වරයා සමග විවාහ වී සතුටින් ජීවත්වූ බව සඳහන් කරමින්ය. නුමුත් ඔවුන් අන්ධකාරයේ ගමන් කරද්දී අනතුරු සහිත තත්ත්වයන් පිළිබඳ අරගල ඇති වන්නට පුළුවන. ඇතැම් විට නයිට්වරයාට තම සහකාරිය බේරා ගැනීමට නොහැකි වන්නට ඇත.

දිනකදී මගේ සැමියා වන්නට යන ස්කොට් හමුවූ අවස්ථාවේ මම ප්‍රේම කරන මනුෂ්‍යයා, මම සැබවින්ම අගය කළ උපදෙස් මා හට දුන් පුද්ගලයා මට හමුවිය. නුමුත් ස්කොට් හට පුරවන්නට නොහැකිවූ සිදුරු මගේ හදවත ගැඹුරෙහි තිබුණේය. ඔහු හා විවාහ වන්න යයි ස්කොට් මා හට පැවසූ අවස්ථාවේ හා අල්තාරය දෙසට ගමන් කිරීමේදී හෝ පොරොන්දු දුන් අවස්ථාවේදී හෝ මගේ අනාරක්ෂිත බව සුවපත්වී නොතිබුණේය.

විවාහය පුද්ගලික සැක දුරු නොකරන්නේය. ඉන් සිදුවන එකම දෙයක් ඇත්නම් ඒ නොවිසඳුනු අනාරක්ෂිත බව වැඩිවීමය. අරගල අනිවාර්යයෙන් පැමිණෙන්නේය. ඒවායේ පැමිණීම අපගේ හදවත්වල තත්ත්වය එළිදරව් කරන්නේය. අපට තවදුරටත් 'පුද්ගලිකයි' යන පුවරුව එල්ලා කාමරය තුළ සැඟවී සිටීමට හැකියාවක් නොමැත. විද්‍යාමාන නොවන බව පෙන්නුම් කිරීමට අප උත්සාහ දරණ අංශ ඒ ආකාරයෙන්ම පවතින බවට හා ගොදුරු විය හැකි අවදානමට විවාහය ලක්කරන්නේය. මම ස්කෝට් ඇසුරු කළ කාලයේ සාර්ථක ලෙස මැඩපැවැත්වූ හඬවල් අප මධුසමය අවසන්කොට පැමිණීමටත් පෙරම යළි මතුවන්නට පටන් ගත්තේය.



ස්කොට් සහ මම එකිනෙකා හා සමීපවන දිනය දෙස මම දැඩි උනන්දුවකින් බලා සිටියෙමි. නුමුත් සම්බන්ධතාවක් තුළට ලිංගිකත්වය ප්‍රමාණවත් ලෙස සන්නිවේදන නොකිරීමේ සියුම් වෙනස්කම් රැගෙන ඒම මම අපේක්ෂා නොකළෙමි. ශාරීරික ලිංගික සංසර්ගය ප්‍රේමයට සමවන බව බොරුවක් යයි අප දැන සිටියදී පවා එය දුරුකිරීම අසීරු මිථ්‍යාවකි. මගේ සැමියා මා ගැන කරන තක්සේරුව විනිශ්චය කිරීමට අපගේ සම්බන්ධතාවේ ශාරීරික පැතිකඩ භාවිතා කිරීමට පටන් ගත්තෙමි. ඔහු අධික

වෙහෙසට පත්ව හෝ පීඩනයට පත්ව හෝ ශාරීරික සම්බන්දතා පැවැත්වීමට නොහැකි අවස්ථාවල මගේ ප්‍රේමය තේරුම් ගැනීම පුළුල් කර ගැනීමට ලැබෙන අවස්ථා මට අහිමි විය. ඒ වෙනුවට ඔහු කුමණ තත්ත්වයක සිටියද මම තරබාරු නොවූයේ නම් ඔහුට මා අවශ්‍යවන බව පවසන හඬවල් වලට ඇහුම්කන් දුන්නෙමි.

ඔහු කාලය ගත කරන ආකාරය පවා මගේ වටිනාකම මනින මිණුම් දණ්ඩක් විය. අප එකට ගත කරන කාලය මදි බව මට හැඟී ගියහොත් මගේ අවසාන තීරණය වූයේ මම ලස්සන නැති බවය. මගේ අනාරක්ෂිත බව ගැටුමේ සැබෑ ස්වරූපයට

**විවාහය පුද්ගලික සැකය පළවා නොහරියි. එය කරන්නේ නොවිසඳුණු අනාරක්ෂිත බව වැඩි කිරීමය.**

හරස් විය. විසඳුමක් සොයා ගැනීම දුෂ්කර විය. මගේ මැවුම්කරුවාණන්ට වඩා මගේ ආත්මාභිමානයට අදාළ කරුණු මගේ සැමියා සමග ඇති සම්බන්ධතාව පාලනය කළේය.

මෙම හඬවල් වල ව්‍යංගය වන්නේ මම ශෝභන බවත් මට ආදරය කරන බවත් පවසන මගේ සැමියාගේ කටහඬ නොනැවතී තිබිය යුතු බවයි. මට ඒවා ඇසුණේ නැත. වඩාත් නිවැරදිව පවසන්නේ නම්, මම ඔහු විශ්වාස කිරීම තෝරා නොගත්තෙමි. දෙවියන්වහන්සේගේ එක් මාහැඟි දීමනාවක් වූ මගේ විවාහය ඒ හඬවල් නිහඬ කළේ නැත. ඊට හේතුවූයේ මගේ සැමියා සමග තිබූ මගේ

සම්බන්ධතාවයට වඩා මගේ අනාරක්ෂිත බව ගැඹුරු වීමය. ඒවා මම කවුරුන්ද යන්න ක්‍රිස්තුස් වහන්සේ සමග සම්බන්ධතාවේ හරය තුළටම ගමන් කරන්නේය.

මගේ සුන්දරත්වය හා වටිනාකම ක්‍රිස්තුස් වහන්සේ තුළ දැකගත හැකි බව මම මගේ මොළයෙන් දැන සිටියත් හදවතින් දැන නොසිටියෙමි. මේ ලෝකයේ සුන්දරත්වය මම අගය කළ බැවින්, මගේ අගය ඒ තුළ සම්බවන බව මම විශ්වාස කලෙමි. මගේ අගයන් ලෝකයේ ප්‍රමිතිය මත පදනම්වූ බැවින් අන් අය ඒ ආකාරයටම මගේ වටිනාකම තීරණය කරනු ඇතැයි මම විශ්වාස කළෙමි.

කිතුණු න්‍යායන් පදනම්වූ බර අඩු කිරීමේ වැඩ සටහනකට මම සම්බන්ධවූ අවස්ථාවේ මම පිළිතුර සොයාගත් බව සිතුවෙමි. මට සැමදා අවශ්‍ය වූ ශරීරය සොයා ගැනීම මගින් මට හඬවල් නිහඬ කළහැක - ඒ ක්‍රියාවලිය තුළ මම දෙවියන්වහන්සේ හඹා යන්නෙමි. වැරදි වුවත් මගේ අභිප්‍රාය එය විය. මම වැඩ සටහනට සම්බන්ධ වූයේ සෞඛ්‍ය සම්පන්න වීමට නොවේ. කෙට්ටු වීමටය.



දෙවියන්වහන්සේට මා තුළ අලුත් හදවතක් මැවීමට හැකිවන පරිදි මම උන්වහන්සේ පසුපස හඹා යමින් නොසිටියෙමි. ජීවත්වන පිණිස නව බාහිර පුද්ගලයෙකු මවන පිණිස මගේ බර අඩු කිරීම මම දෙවියන්වහන්සේට භාර දෙමින් සිටියෙමි.

හඬවල් මැඩ පැවැත්වීමේ ක්‍රමයක් මම සොයා ගතිමි. එහෙත් ඒවා නිහඬ වූයේ නැත මම කැඩපත දෙස බැලූ විට මට ඇසුණේ "මම හරි මහතයි" කියන හඬය මම වඩාත් ක්‍රියාශීලී ලෙස වැඩසටහන අනුගමණය කලෙමි මම හඬවල් සමග සටන් කළෙමි. මම කැඩපත දෙස බලා "මම සුන්දර බව කවුරුත් දකින්නේ නැත" යන හඬ ඇසෙන විට මගේ බර අඩුවීම ගැන අන් සියලුදෙනා පවසනු ඇසූ ශුභවාදී දේවල් ඒ වෙනුවට ආදේශ කළෙමි. කැඩපත දෙස බලා "මම අන් කාන්තාවන් වගේ නොවෙයි" යන හඬ ඇසූ කල පෙර මට නොගැලපුනු එහෙත් දැන් මට ගැලපෙන කුඩා ප්‍රමාණයේ ඇඳුම් දෙස බැලුවෙමි.

එසේ වුවත් සැබවින්ම මම හඬවල් පරාජය කරමින්

නොසිටියෙමි. මම සිටියේ ඒවා පෝෂණය කරමින්ය. මගේ බර අඩුවන තාක් කල් මට මාව පිළිගන්නට හැකි වන්නේය. මගේ වටිනාකම බාහිර පෙනුම වෙත නැවත හැරුණි. මම දැන් බර අඩුකර ගැනීම ආත්මික හික්මවීමක් බවට පත්කොට ගෙන තිබුණි. කෙට්ටුවීම ආත්මිකවීම සමග සමාන කිරීමට පවා මම පටන් ගත්තෙමි.

වැඩ සටහනට සති දහතුනක් ගතවන විට මගේ බර රාත්තල් 22 කින් අඩුවිය. මගේ බර පමණක් නොව ආත්මික බවද පාලනය වී ඇති බව මට හැඟී ගියේය දෙවියන්වහන්සේ

**මම මා ගැන අසතුටින් පසුවන බැවින් දෙවියන්වහන්සේ මා ගැන අසතුටින් පසුවන බව මම විශ්වාස කළෙමි.**

පසුපස හඹා යාම රටාවකට අනුකූලව සිදුවීමට පටන් ගත්තේය. බැදපු කුකුල්මස් අනුභව කිරීම පව්කාර ක්‍රියාවකි. අමු එළවළු අනුභව කිරීම භක්තිවන්ත ක්‍රියාවකි. ඒ ආකාරයට මම වැඩි වශයෙන් ව්‍යායාම කරන විට වැඩි වශයෙන් ආත්මික බව මට හැඟුණේය. මම මා ගැන අසතුටින් පසුවූ බැවින් දෙවියන්වහන්සේ මා සමග අසතුටින් පසවූ බව මම විශ්වාස කළෙමි. දැන් මම කෙට්ටු බැවින් දැන් මට දෙවියන්වහන්සේ සතුටු කිරීමට පටන් ගැනීමට පුළුවන. නමුත් මගේ සෑහීමට පත්වීම සියුම් නූලකින් එල්ලෙමින් තිබුණේය.

මගේ පෙනුම වෙනස් කරන්නයයි ආහාර පාලනය කිරීමට උපකාර කරන්න යයි, දිනපතා ව්‍යයාම් කිරීමට උපකාර කරන්න යයි,

ගැළපෙන ඇඳුම් තෝරා ගැනීමට උපකාර කරන්න යයි, වෙන කව්රුවත් නොව මම මාවම කරන්න යයි දෙවියන්වහන්සේගෙන් ඉල්ලුවෙමි. මගේ සියලුම අනාරක්ෂිත බවට විසඳුම් ඉල්ලා සිටියත් එක් ඉරුදිනක දහවල වනතුරු මගේ හදවත වෙනස් කරන්න යයි නොඉල්ලුවෙමි. දේවස්ථානයට ගොස් ආපසු පැමිණි මම කාමරයට ගොස් ඒ ඇඳුම් පිටින්ම ඇඳේ ගුලි වුණෙමි. මම පතුලටම කිඳා බැස තිබුණේය. බිඳුණු හදවතින් හැඟීම් බරවූ මම හඬන්නට වූයෙමි. මාව වෙනස් කරන්න යයි දෙවියන්වහන්සේගෙන් යදින්නට වුණෙමි. පළමු වරට මම ශබ්ද නඟා වචන පිටකළෙමි. මගේ ශරීරයට හා මට වෛර කරන බව දෙවියන්වහන්සේට පැවසුවෙමි. නුමුත් මට දිගින් දිගටම වෛර කිරීමට මට අවශ්‍ය නොවීය. ලෝකය මට දායාද කොට තිබෙන සුන්දරත්වයේ සෙවනැළි ස්වරූපය නොකඩවා පළවා හැරීමටද මට අවශ්‍ය නොවීය.



මාව කෙට්ටු කරන්න යයි හා සුන්දර කරන්න යයි දෙවියන්වහන්සේගෙන් ඉල්ලීම මම එදින නවතා දැමුවෙමි. ඒ වෙනුවට දෙවියන්වහන්සේ මා තුළ දකින සුන්දරත්වය තේරුම් ගැනීමට මට උගන්වන්න යයි උන්වහන්සේගෙන් ඉල්ලා සිටියෙමි. එම සරළ වචන දිගු ගමනක ආරම්භයක් විය. උන්වහන්සේගේ ජීවිතයෙන් මිළක් ගෙවූ තැනැන්වහන්සේගේ හදවතෙහි ඇති මිළ කළ නොහැකි සුන්දරත්වය තේරුම් ගැනීමට යන ගමනක්ය.

මා තුළවූ හඬවල් සමග කළ අරගලය, මා හට අගය ලබා දෙන්නාවූ තැනැන්වහන්සේ තුළ මගේ අගය සොයා ගත යුතු බව මට උගන්වමින් තිබුනේය. මා වටා තිබූ ජයග්‍රහණ හා ලබා ගැනීම්වලට මගේ අගය තහවුරු කළ නොහැකි වන්නේය. අන්‍යයන්ගේ ප්‍රේමය සොයා යෑමෙන් හෝ බාහිර පෙනුම වෙනස් කිරීමෙන් හෝ මට මගේ අගය තහවුරු කළ නොහැකි වන්නේය. අභ්‍යන්තර හඬවල් දුර්වලකම මත සමෘද්ධිමත් විය. නුමුත් මම සවන් දෙනු ඇතැයි ගැඹුරු පණිවිඩයක් බලා සිටියේය. "අපව

සාදා ඇත්තේ බොහෝ දේ උදෙසාය". දෙවියන් වහන්සේ අපගේ ශක්තිය වන සේක. ඒ ශක්තිය දුර්වල කමේදී සම්පූර්ණ වන්නේය (2 කොරින්ති 12:9).

අප තුළ ඇති හා හඬ නොමැති කටහඬවල්

**නිර්මාණාත්මක විවේචනවලට තැනක් ඇත. එහෙත් අසමත් බව හා අදක්ෂ බවට නඟන චෝදනා වලට ඉඩ නැත.**

වලට එරෙහි අපගේ යුද්ධයේදී අප හඳුනාගත යුතු සත්‍යතා සතරකි.

**පලමුව,** අප අන් අයගෙන් අසන වචන අප ජීවත් විය යුතු සිතිවිලි අඟවන්නාවූ ශුද්ධ ලියවිල්ල තුළින් පෙරා ගත යුතුය. "ඉතින් සහෝදරයෙනි, යම් පමණ දේ සැබෑද, යම් පමණ දේ ගරුකටයුතුද, යම් පමණ දේ සාධාරණද, යම් පමණ දේ පිරිසිඳුද, යම් පමණ දේ ආදරණීයද, යම් පමණ දේ යහපත් කීර්තියක් ඇතිව තිබේද, යම් ගුණයක්, යම් ප්‍රශංසාවක් ඇද්ද, ඒ දේවල් මෙනෙහි කරන්න" (පිලිප්පි 4:8).

නිර්මාණාත්මක වචනවලට ස්ථානයක් ඇත. නුමුත් අසමත්බව හා අදක්ෂ බව ගැන නඟන චෝදනාවලට ස්ථානයන් නැත. අප ගැන හා ඔවුන් ගැන අන්‍යයන් පවසන දේවල් අපට ඇසෙන විට, එම ප්‍රකාශයන් පිළිබඳ පෙර පුහුණුව අප ක්‍රිස්තුස් වහන්සේ තුළ කවුරුන්ද යන්න තේරුම් ගැනීම ශක්තිමත් කරන්නේද හෝ රහසින් හානි කරන්නේද යන්න අප විසින්

උන්වහන්සේද : මාගේ කරුණාව නුඹට සෑහේය. මක්නිසාද දුර්වලකමේදී මාගේ බලය සම්පූර්ණවන්නේයයි මට කී සේක. එබැවින් ක්‍රිස්තුස්වහන්සේගේ ශක්තිය මා කෙරෙහි පිහිටන පිණිස මාගේ දුර්වලකම් ගැන ඉතා සන්තෝෂයෙන් පාරට්ටු කරන්නෙමි" (2 කොරින්ති 12:9)

තීරණය කළ යුතුය.

**දෙවනුව,** අප ගැන අප කථා කරන ආකාරය වෙනස් කළ යුතුව ඇත. අප අපට සමච්චල් කරන විට අපි දෙවියන්වහන්සේගේ මැවිල්ලට ශාප කරන්නෙමු. "ඔබ එය යහපත් යයි පැවසූ බව මම දනිමි. එහෙත් ඒක එතරම් හොඳ නැත" යනුවෙන් අපි නිතරම දෙවියන් වහන්සේට කියන්නෙමු. අපි දෙවියන්වහන්සේගේ මැවිල්ලට ශාප කරන මුඛයෙන්ම උන්වහන්සේට ප්‍රශංසා කරන්නේ හා නමස්කාර කරන්නේ කෙසේද? "මාගේ පර්වතයද මිදුම්කරුද වූ ස්වාමිනි, මාගේ මුඛයෙහි වචන හා සිතෙහි භාවනාද ඔබ ඉදිරියෙහි පිළිගැන්මට සුදුසු වේවා" (ගීතාවලිය 19:14) යයි ශුද්ධ ලියවිල්ලෙහි සඳහන් වන්නේය. යේසුස්වහන්සේ මෙසේ ඉගැන්වූ සේක. "මුඛය කථා කරන්නේ සිතෙහි පූර්ණකමෙන්ය" (ලූක් 6:45). නිග්‍රහ කරන්නාවූ වචන, හදවතෙහි ගැටළුවක් ඇති බව එළිදරව් කරන්නේය. අපගේ හදවත ඇහුම්කන් දෙන්නේ ජීවිතය ගන්නාට මිස ජීවිතය දෙන්නාට නොවේ.



**තුන්වෙනුව,** අපගේ ආත්මය විනාශ කිරීමට සොයන්නා විසින් පවසනු ලබන වචන හඳුනා ගැනීමට අප ඉගෙන ගත යුතුය. සාතන් බොරුකාරයෙකි. ඔහු එන්නේ "සොරකම් කරන්ටත්, මරන්ටත්, විනාශකරන්ටත්ය" (යොහාන් 10:10). ඔහුගේ පැවැත්මේ හරය මුළාකිරීමය. එබැවින් ඔහු කථා කරන සියල්ල සත්‍යයෙන් තොරය. ඔහුගේ වචන ඇසෙන විට අපට ඒවා හඳුනාගත හැකිය. ඔහු කථා කරන්නේ වෛරයේ, අසමත්කමේ හා අසහනයේ වචනය.

"මම කවදාවත් සාර්ථක වෙන්නේ නැහැ"

"මට කවදාවත් ලස්සන වෙන්න බැහැ"

"මගේ අසමත්කම් සියල්ලටම හේතුව මමයි"

"මම කෙට්ටු වුණා නම්, මම සතුටින් සිටිමි"

"මට කිසිවක් හොඳින් කරන්න බැහැ"

"මට අලුත් ඇඳුම් තිබුණා නම් මගේ පෙනුම ගැන මට සතුටු වෙන්න තිබුණා"

"මම හරි මහතයි"

සියල්ලම බොරුය. ඒවා ජීවනයේ නොව මරණයේ වචනයි. අප නොවටිනා බව ඔහුට තහවුරු කළ හැකි නම්, අපව නිශ්චල කොට අපගේ ජීවිත උදෙසා වන දෙවියන්වහන්සේගේ සැළැස්ම සම්පූර්ණ කිරීමෙන් අපව වළක්වන්නට ඔහුට පුළුවන. ප්‍රතික්ෂේප වනු ඇතැයි යන බිය නිසා අපි වෙනත් කෙනෙකුට සමීප නොවන්නෙමු. අප දැඩිව අපිව පිළිකුල් කරන්නෙමු. අසමත් වේ යයි යන බිය නිසා අපගේ සිහින අනුගමණය නොකරන්නෙමු. අපි අසහනය තුළ ගිලෙන්නෙමු.

අපි නිර්භීත ලෙස මුහුණට සිනහවක් මවා ගත්තද හඬවල උද්ඝෝෂණය අපගේ හිසෙහි රැව් දෙන්නේය. අප මෙම හඬවල් සමග ජීවත් විය යුතු බව අප සෙමින් පවසා අප අපේක්ෂා

දෙවියන්වහන්සේ අපට දී ඇති නොමසුරු ප්‍රේමය දෙස බැලීමට අප බොහෝ අවස්ථාවන්හි අසමත් වන්නෙමු. එය, අප උන්වහන්සේගේ දරුවෝ යයි කියනු ලබන්නට අවසර දෙන්නාවූ ප්‍රේමයකි. (1 යොහාන් 3:1)

**අප නොවටිනා බව තහවුරු කිරීමට ඔහුට (සාතන්ට) හැකිනම්, අපව දුර්වල කොට අපගේ ජීවිත උදෙසා වන දෙවියන් වහන්සේගේ සැලැස්ම සම්පූර්ණ කිරීම වැළැක්වීමට ඔහුට පුළුවන**

කරන සාමය සහ ස්වයං ප්‍රත්‍යක්ෂණය ඇති බව මවා පෙන්වන්නෙමු. එහෙත් තමන් හෙළා දකින්නාවූ සෑම වචනයක් සමගම එය අපගේ ඇඟිලි අතරින් රිංගා යන්නේය. එවිට හඬවල් තවත් දුෂ්ට බවට පත්වන්නේය.

"දෙවියන්වහන්සේ සැබවින්ම සැළකිලිමත් වූයේ නම් උන්වහන්සේ ඔබව මේ වගේ

මවන්නේ නැහැ"

"ඔබ සිටින පරිදි ඔබට ප්‍රේම කිරීමට දෙවියන්වහන්සේට නොහැකි නම්, උන්වහන්සේගේ ප්‍රේමය සත්‍යයක් නොවේ"

"ඔබ ඇත්ත වශයෙන්ම ආත්මික නම්, ඔබට ප්‍රේම කිරීමට මෙතරම් වෙහෙසෙන්නේ නැහැ"

බොරු. සියල්ලම බොරු. ඒවා බොරු බව අප පවසන විට ඒවායේ බලය අහෝසි වී සත්‍යය වඩාත් පැහැදිළි වන්නේය. සුන්දරත්වය විද්‍යාමානය. ඉවසිලිවන්ත ප්‍රේමවන්තයෙකු මෙන් දෙවියන්වහන්සේ අප වෙනුවෙන් බලා සිටින සේක.


**අවසාන වශයෙන්,** අප ගැන දෙවියන්වහන්සේට පවසන්නට ඇත්තේ මොනවාදැයි යන්නට අප සවන්දිය යුතුය.

කාලය ආරම්භ වීමට පෙර මම ඔබ දැන සිටියෙමි. ඔබගේ දෑස් කුමන පැහැයෙන් යුක්තවනු ඇද්ද කියා මම දැන සිටියෙමි. ඔබගේ සිනහ හඬ මම ඇසුවෙමි. තම දියණියගේ ඡායාරූපයක් අත දරා සිටින අහංකාර පියෙකු ලෙස මම ඔබගේ ප්‍රතිරූපය මගේ දෑසේ දරා සිටියෙමි. මක්නිසාද ඔබ මවනු ලැබුවේ මගේ ස්වරූපයටය. කාලය ආරම්භ වීමට පෙර මම ඔබ තෝරා ගතිමි. ඔබගේ නාමය මම අහස් තලයට කීවෙමි. එහි ස්වර මාධූර්යය. මගේ හදවතෙහි බිත්ති සිසාරා දෝංකාර දෙන විට මම සිනහසුනෙමි. ඔබ මගේය. ඔබට ඇති මගේ ප්‍රේමය අහසේ තරුවලට වඩා පැතිර පවතින අතර ඕනෑම සයුරකටත් වඩා ගැඹුරුය. ඔබ මගේ මහත් වටිනා මුතු කැටයයි. මම ඔබට සියල්ල දුනිමි. මගේ හස්තයේ ඔබ නළවන්නෙමි. ඔබ අසමත්ව සිටියදී පවා මම ඔබට ප්‍රේම කරමි. ඔබ පවසන හෝ කරන කිසි දෙයකින් මා ඔබට ප්‍රේම කිරීම නවතාලිය නොහැක. මම අඛණ්ඩව ඔබ සොයා එමි. මගෙන් ඉවතට දිව යන්න - දිව යන්න මම ඔබට ප්‍රේම කරමි. මා ප්‍රතික්ෂේප කරන්න - කරන්න මම ඔබට ප්‍රේම කරමි. ඔබ කෙරෙහි ඇති මගේ ප්‍රේමය ලෝකයේ අත්තිවාරම දැමීමට පෙර සතුටින් ඉපිල ගියේය. එසේම මා ඔබ වෙනුවෙන් කල්වාරියේ කළ ජීවිත පූජාව ගැන කිසිවිටෙක පසුතැවිලි නොවූයෙමි. ඔබගේ සියලු අංශ දකින විට මම මගේ දැඩි ආශාව සිහින් හඬින් පැවසුවෙමි. ඔබ විද්‍යාමාන වූ කල මගේ හස්ත කර්මාන්තය ගැන මවිත වූයෙමි. ඔබ ශෝභමානය.

මම ඔබගේ හදවත සිත හා සිරුර කෙරෙහි සතුටු වෙමි. ඔබ මගේ ආශාවයි. ඔබ ලජ්ජාවෙන් හිස ඉවතට හරවා ගන්නා විට හා මා සැදු දේට අවමන් කරන විට වුවද මම මෘදු ලෙස ආශාවෙන් ඔබට සමීප වන්නෙමි. ඔබ මාගේ ප්‍රේමවන්තයාය. මම ඔබගේ ප්‍රේමවන්තයා වෙමි. (කතෘගේ උපුටා ගැනීම් : 1 යොහාන් 3:2, යෙසායා 43:1; මතෙව් 13:46; එපිස 1:4; එළිදරව් 13:8; ගීතාවලිය 149:4; ප්‍රේම ගී 7:10, 6:3).

අප දෙවියන්වහන්සේගේ සුන්දරත්වය දැන ගන්නවාට උන්වහන්සේ දැඩි කැමැත්තක් දක්වන සේක. නුමුත් අපට ඇසෙන හඬවල්වලට ප්‍රතිචාර දක්වන්නේ කෙසේද යන්න අප තෝරා ගත යුතුය.

හඬක් නොමැති හා අතුළාන්තයේ හඬවල් යථාර්ථය විකෘති කරන්නේය. විනාශකාරී කර්කශ වාග් විලාසයට ඉහළින් දෙවියන්වහන්සේගේ හඬ ඇසීම අඛණ්ඩ අරගලයකි. අපට හඬවල් කිසිදාක නිහඬ කළ නොහැකිය. නුමුත් අප කවුරුන්ද යන්න හඬවල් නිර්වචනය කිරීම තෝරා ගැනීම හෝ නොගැනීම අපට කළ හැකිය. සැබෑ සුන්දර බව දැනගන්නා සංචාරයක එනම් උන්වහන්සේගේ හදවතට ප්‍රවේශමෙන් සවන් දෙමින් හා උන්වහන්සේගේ වචනය නමැති කැඩපතට එබී බලමින් ආරම්භ කරන සංචාරයකට මඟ පෙන්වීමට දෙවියන් වහන්සේ මඟ බලා සිටින සේක.



තුන

# නව දෘෂ්ඨිකෝණයක්

එක් ගිම්හාන කාලයක මමත් මගේ සැමියාත් මිෂනාරි චාරිකාවක් සඳහා තරුණ කණ්ඩායමක් චිකාගෝහි ප්‍රධාන නගරයට රැගෙන ගියෙමු. අපගේ සත්කාරකරු අප නවාතැන් ගැනීමට නියමිතව තිබු නිවස වෙත රැගෙන යද්දී ඈත තිබූ උස ගොඩනැගිලි දෙකක් දුටුවෙමු. එක් ගොඩනැගිල්ලක් අනිත් එකට වඩා උස බව පැහැදිලිව පෙනෙන්නට විය. උස ගොඩනැගිල්ල සියර්ස් (Sears) කුළුණදැයි අපි ඔහුගෙන් විමසුවෙමු. අප පුදුමයට පත්කරමින් ඔහු පැවසුවේ සියර්ස් කුළුණු ලෙස අප වරදවා සිතූ කුළුණ ජෝන් හැන්කොක් ගෙඩනැගිල්ල බවය. මඳක් ආක්‍රමණශීලිව හා බොහෝ අඥානව මම තීරණය කළේ අපගේ සත්කාරකරු වැඩියෙන් සංචාරය නොකරන බව හෝ චිකාගෝ නගරයේ උසම ගොඩනැගිල්ල සියර්ස් කුළුණ බව ඔහු නොදන්නා බවය. ජෝන් හැන්කොක් ගොඩනැගිල්ල ලෙස ඔහු හඳුන්වන කුළුණ සියර්ස් කුළුණට වඩා විශාල බව පැහැදිලිය.

අපි නගරය වටා සැරිසරද්දී අපගේ දෘෂ්ඨිකෝණය වෙනස් විය. අපගේ මතය අවසානයේ ඔහුගේ අවධාරණය කිරීම හා ගැළපුණේය. වඩා උස ගොඩනැගිල්ල මිටි ගොඩනැගිල්ල බවටත්

මිටි ගොඩනැගිල්ල උස ගොඩනැගිල්ල බවටත් පත්විය. වෙනස පැහැදිලිව පෙනෙන්නට තිබුණි.

යමක සාපේක්ෂ වැදගත්කම රඳා පවතින්නේ ඔබගේ තීරණය මත බව මම එදින ඉගෙන ගතිමි.

ඊට පෙර එම ගිම්හානයේම මමත් මගේ සැමියාත් පාසැල් සමයේ මිතුරන් කිහිප දෙනෙකු බැහැ දැකීමට නිව් ජර්සි බලා ගමන් කළෙමු. අවම වශයෙන් වසර හතරකින් හෝ ඔවුන්ගෙන් කිසිවකු මම දැක තිබුණේ නැත. ඒ කාලයේදී මගේ බර රාත්තල් 30 කින් වැඩිවී තිබුණු අතර එය අවසන් කල යුතු යයි මා සිතූ ප්‍රශ්න ගැටළු සමග පොර බදිමින් සිටින බව මට දැනුණේය. විශේෂයෙන් එක් මිතුරියක බැහැදැකීමට මා ගිය අවස්ථාවේ දෙවියන්වහන්සේගේ සුන්දරත්වය තේරුම් ගැනීමේ නව මාවතක උන්වහන්සේ මා ගෙන ගිය සේක.



උසස් විදුහලේ දෙවන වසරේ ඉගෙනුම ලබමින් සිටියදී අප අතර මිත්‍රත්වයක් ඇති විය. අප නැදෑකමේ ආත්මයක් බෙදා ගත්තෙමු. දැන් අප දෙදෙනාම විවාහ වී එකිනෙකාගේ කැඳවීම හඹා යන්නෙමු. අප ප්‍රීතියෙන් හා මවිතයෙන් එකිනෙකාට ආචාර කළෙමු. මා මෙන්ම ඇයද මේ වසර ගණනාව තුළ තරබාරුවී ඇත. උසස් පාසලේ දෙවන වසරේ ශිෂ්‍යාවකව සිටියදී තරබාරුකම අඩුකර ගැනීමට තවදුරටත් පීඩනයක් මට ඇති නොවීය. මගේ ශරීරයේ වෙනස්කම් ගැන ඇය සිතන්නේ මොනවාදැයි යන්න පිළිබඳව මම තවදුරටත් කනස්සලු නොවූයෙමි.

අප උසස් විද්‍යාලයේදී ගත් ඡායාරූප ඇල්බමයක පිටු පෙරළමින් සිටියදී දෘෂ්ටී කෝණය පිළිබඳව වටිනා පාඩමක් දෙවියන්වහන්සේ මට ඉගැන්වූ සේක. පිටු පෙරළන අතරතුර හදිසියේ ඇය මෙසේ කීවාය. "මේ ඡායාරූප දකින විට මට මොනවද හිතෙන්නේ කියලා ඔයා දන්නවාද? මම ඒ කාලේ කොයිතරම් කෙසඟද කියලා" ඇය කීවාය. මොහොතක් නිහඬව සිටි මා "මේ ඡායාරූප ගන්න කාලේ මම හිතුවා මම කොච්චර

මහතද කියලා" මම කීවෙමි.

චිකාගෝහී උසම ගොඩනැගිල්ල කුමක්ද එකදැයි දකින පිණිස නිවැරදි දෘෂ්ඨි කෝණයක් මට තිබිය යුතු වූවා සේම සැබෑ සුන්දරත්වය

**පවතින තත්ත්වයන් මොනවා වුවත් මා නිරන්තරයෙන් නිර්වචනය කරන ආකාරය තුළින් මගේ අනන්‍යතාව මා කව්රුන්ද යන්නෙහි හරය වන්නේය**

දෙවියන්වහන්සේගේද ලෝකයේදැයි දකින්නට මට නිසි දෘෂ්ඨි කෝණයක් අවශ්‍ය විය.

නිසි දෘෂ්ඨි කෝණයක් ඇතිවන්නේ අප දෙවියන්වහන්සේ දකින ආකාරයට බලන විටය. දෙවියන් වහන්සේ දකින ආකාරයට දකින තැනැන්වහන්සේ තුළ මගේ අනන්‍යතාව මම සොයා ගත යුතුය. සැබෑ සුන්දරත්වය දැන ගැනීමට මම ක්‍රිස්තුස්වහන්සේව හඳුනාගත යුතුය. පවතින තත්ත්වයන් මොනවා වූවත් මා නිරන්තරයෙන් නිර්වචනය කරන ආකාරය අනුව මගේ අනන්‍යතාව මා කවුරුන්ද යන්නෙහි හරය වන්නේය. එසේ වුවද ක්‍රිස්තුස් වහන්සේ තුළ අනන්‍යතාව අපගේ පුද්ගලික චරිත ලක්ෂණවල ඉවසා සිටීමේ වටහාගැනීමක් නොවේ. ක්‍රිස්තුස්වහන්සේ තුළ ඇති අනන්‍යතාව බලවත් ජීවමාන බලයකි. මගේ අනන්‍යතාව මගේ ජීවිතයේ නිර්වචනය හා හැඩ ගැසීම වන්නේය. "මම ක්‍රිස්තුස්වහන්සේ සමග කුරුසියෙහි ඇණ ගසනු ලැබ සිටිමි. එසේවී නුමුත් මම ජීවත්වෙමි. නුමුත් තවත් මා නොව ක්‍රිස්තුස්වහන්සේ මා තුළ ජීවත්වන සේක. තවද මා දැන් මාංසයෙහි ජීවත්වන ජීවිතය මට ප්‍රේම

කළාවූ මා උදෙසා තමන්ව පාවා දුන්නාවූ දෙවියන්වහන්සේගේ පුත්‍රයාණන්වහන්සේ කෙරෙහි ඇදහිල්ලෙන් ජීවත් වෙමි" (ගලාති 2:20). ශාරීරික සුන්දරත්වය තේරුම්ගැනීම සමග මාංසය කෙරෙහි මා තුළවූ ආශාව ක්‍රිස්තුස්වහන්සේ සමග කුරුසපත් කොට ඇත. ඒ වෙනුවට මා තුළ ඇති සුන්දරත්වය වන්නේ මාංසයේ නොව ආත්මයාණන්වහන්සේගේ සුන්දරත්වයයි.

තවදුරටත් පවසන්නේ නම් මගේ සුන්දරත්වය සමග මගේ ශරීරය, යේසුස් ක්‍රිස්තුස්වහන්සේ සමග ඇති මගේ සම්බන්ධතාවේ සංකේතය වන්නේය. පාවුල් තුමා මෙසේ සටහන් කරමින් මෙම අදහස පැහැදිළි කරන්නේය. "ක්‍රිස්තුස්වහන්සේගේ ප්‍රේමය අප කෙරෙහි බලපවත්වන්නේය. එක් කෙනෙක් සියල්ලන් වෙනුවට මැරුණේය කියාත් එබැවින් සියල්ලෝම මැරුණෝය කියාත්; උන්වහන්සේ සියල්ලන් වෙනුවට මැරුණේය කියාත් අපි නිශ්චය කොට කියමුව. එහෙයින් ජීවත්වන කිසිවෙකු තවදුරටත් තමන් උදෙසා ජීවත් නොවී, ඔවුන් උදෙසා මිය ගොස් නැවත නැගිටුණාවූ තැනන්වහන්සේ උදෙසා ජීවත්විය යුතුය" (2 කොරින්ති 5:14-15, කළු අකුරු එකතු කර ඇත).



මගේ ජීවිතයේ තවදුරටත් මා උදෙසා නොවේ. ලෝකාකාරයෙන් මගේ සුන්දරත්වය නිර්මාණය කිරීමට උත්සාහ කිරීම ක්‍රිස්තුස්වහන්සේ තුළ මගේ ඇති අනන්‍යතාවෙන් වෙන්වීමය. සුන්දරත්වය පිලිබඳ ලෝකයේ මතය දරා සිටීම යනු මගේ ආශාවන් කුරුසපත් කිරීම ප්‍රතික්ෂේප කොට කැමැත්තෙන් මාංසයේ ජීවත්වීමය.

එවිට ගැටළු දෙකක් මතු වන්නේය. මම ක්‍රිස්තුස්වහන්සේගේ අනන්‍යතාව තුළ ජීවත් වන්නේ කෙසේද හා ලෝකාකාර සුන්දරත්වයෙන් ආත්මික සුන්දරත්වයට මගේ දෘෂ්ඨී කෝණය වෙනස් කරගන්නේ කෙසේද යන්නය. මම මාංසයේ හා ආත්මයේ කෙනෙකු වන්නෙමි. මගේ පෙනුම වැදගත් නොවන බව පැවසීමට හැකියාවක් මා හට නොමැත.

අප යේසුස්වහන්සේ තුළ අපගේ අනන්‍යතාව හා සුන්දරත්වය සොයා ගන්නේ කෙසේද යන්න උන්වහන්සේ එක් සරළ

ප්‍රකාශයකින් දැක්වූ සේක. උතුම් වන්නේ කුමන ආඥාවදැයි උන්වහන්සේගෙන් විමසූ අවස්ථාවේ "ඔබගේ මුළු හෘදයෙන්ද මුළු ආත්මයෙන්ද මුළු බුද්ධියෙන්ද ඔබගේ දෙවිවූ ස්වාමින්වහන්සේට ප්‍රේම කරව. මේක උතුම්වූ පළමුවෙනිවූ ආඥාවය"යි පිළිතුරු දුන් සේක (මතෙව් 22:37-38). මම මාගේ මුළු පැවැත්මෙන් දෙවියන්වහන්සේ සොයන කල මා හට අවශ්‍ය දේවල් සියල්ල වෙනස් වනු ඇත. ලෝකාකාර ආශාවන් මිය යනු ඇත. උන්වහන්සේ තුළ හා උන්වහන්සේ උදෙසා ජීවත්වීම මගේ නව ආශාව වනු ඇත. ක්‍රිස්තුස්වහන්සේ තුළ මගේ අනන්‍යතාව සොයා ගැනීම තුළ මගේ ආත්මය, සිත හා ශරීරය නිර්වචනය කිරීමට දෙවියන්වහන්සේට ඉඩ දෙන්නෙමි.

අපගේ නව අනන්‍යතාව තේරුම් ගැනීමට උපකාරවන පිණිස දෙවියන්වහන්සේ අපට

**අපට මඟ පෙන්වීමට ශුද්ධාත්මයාණන්වහන්සේට ඉඩ දෙන්න. එවිට අප ලෝක ප්‍රමිතියට වහලුන් බවට පත්වීම මඟ හරින්නෙමු... ක්‍රිස්තුස්වහන්සේ තුළ සැබෑ සුන්දරත්වය සොයා යාමට අපි නිදහස් වන්නෙමු.**

ශුද්ධාත්මයාණන් වහන්සේ දී ඇත:

"මක්නිසාද දෙවියන්වහන්සේගේ ආත්මයාණන් වහන්සේ විසින් ගෙන යනු ලබන යම් පමණ දෙනෙක් ඇද්ද එපමණ දෙනා දෙවියන්වහන්සේගේ පුත්‍රයෝය. මක්නිසාද නුඹලා භය උපදවන දාසකමේ ආත්මය නැවත නොලබා, පුත්‍රකමේ ආත්මය

ලබාගත්තහුය; එයින් අපි; අබ්බා පියාණෙනි, කියා හඬගසමුව. අපි දෙවියන්වහන්සේගේ දරුවෝයයි ආත්මයාණන්වහන්සේම අපේ ආත්මය එක්ව සාක්ෂි දෙන සේක" (රෝම 8:14-16).

අපට මඟ පෙන්වීමට ශුද්ධාත්මයාණන් වහන්සේට ඉඩ හරින විට, සුන්දරත්වය පිළිබඳ ලෝකයේ ප්‍රමිතියට වහල්වීමෙන් ඉවත්වී ඒ වෙනුවට ක්‍රිස්තුස්වහන්සේ තුළ සැබෑ සුන්දරත්වය සොයා ගැනීමට නිදහස් වන්නෙමු. "අප දෙවියන්වහන්සේගේ දරුවන් බව ශුද්ධාත්මයාණන් වහන්සේම සාක්ෂි දෙන විට" දෙවියන්වහන්සේ අපව හා අපගේ සුන්දරත්වය දකින ආකාරයට දකින්නට පටන් ගන්නෙමු. ලෝකය මා දකින ආකාරයට නොව මා ක්‍රිස්තුස්වහන්සේ තුළ සිටින ආකාරය, දෙවියන්වහන්සේ දකින ලෙසට මම දකිනු ඇති බැවින් සුන්දරත්වය පිළිබඳ මගේ වටහා ගැනීමට නිසි දෘෂ්ඨි කෝණයක් ඇති වන්නේය.

සුන්දරත්වය පිළිබඳ අපගේ මතය වෙනස් කිරීමේ ශුද්ධාත්මයාණන් වහන්සේගේ භූමිකාව වටහා ගැනීමට දෙවියන්වහන්සේගේ සුන්දරත්වය පිළිබඳ සත්‍යය දැන ගැනීමට සියුම් අවබෝධය අපට ලබා දෙන්නාවූ ශුද්ධාත්මයාණන් වහන්සේ යනු සත්‍යයයේ ආත්මයාණන් බව අප වටහාගත යුතුය. අප අසන දේවල් දෙවියන්වහන්සේගේ හදවත එළිදරව් කරන අතර ඒ හේතුවෙන් දෙවියන්වහන්සේගේ වචනය සමග අනුගත වන්නෙමු. දෙවියන්වහන්සේගේ ආඥා වලට සවන් දීමට අකැමැති නම් හා ඒවාට අනුකූලව ජීවත් නොවන්නෙමු නම්, ශුද්ධාත්මයාණන් වහන්සේට සවන් දීමට අපට නුපුළුවන. අප ලෝක දෘෂ්ඨිකෝණයෙන් අප පිළිබඳව මත දැරීම තුළ ස්ථිරව සිටින්නෙමු නම් ආත්මයාණන් වහන්සේට වුවද දෙවියන්වහන්සේගේ සුන්දරත්වයේ සත්‍යය එළිදරව් කිරීමට නොහැකිය. අප දෙස හා අන්‍යයන් දෙස සුන්දරත්වයේ භක්තිවන්ත දෘෂ්ඨිකෝණයකින් බැලීමට යොමුවන විට ශුද්ධාත්මයාණන් වහන්සේ උපදේශකයාණන් ලෙස උන්වහන්සේගේ භූමිකාව සම්පූර්ණ කරන සේක.

මෙම පරිවර්තනයවීම සිද්ධියක් නොව ක්‍රියාවලියකි. ඊට දිනපතා අලුත්වීම අවශ්‍යය. එපීසයේ පළමුවන සියවසෙයි සභාවේ ඇදහිලිවන්තයින් හට පාවුල් මෙසේ ලියා යැව්වේය.

"නුඹලා නුඹලාගේ චිත්තාත්මයෙන් අලුත්කරනු ලැබ, සැබෑවේ ධර්මිෂ්ඨකමින්ද ශුද්ධකමින්ද දෙවියන්වහන්සේට සමානව මවන ලද්දාවූ අලුත් මනුෂ්‍යයා පැළඳගන්න" (එපීස 4:23-24). චිත්තාත්මයෙන් අලුත්කරනු ලැබීමට ක්‍රියාත්මක වීම අවශ්‍යය අප "අලුත් මනුෂ්‍යයා පැළඳ ගත යුතුය".

වෙනත් වචනයකින් පවසන්නේ නම්, දෙවියන්වහන්සේ මා දකින ආකාරයට මම මා දෙස බැලිය යුතුය. මගේ ජීවිතයේ සියලු දේවල් ආත්මික වටිනාකමකින් යුක්තව සිතා බැලීමට මම පුරුදුවිය යුතුය. ලෝකය සුන්දරත්වය පිළිබඳව කරන්නාවූ නිර්වචනය මා ඉවත දැමිය යුතුය. මා තරබාරු කරන්නේ හෝ කෙට්ටු කරන්නේ කුමණ ආහාරවලින්දැයි තක්සේරු කරමින් ආහාර ගන්නවාට වඩා මා විසින් කළ යුතුවූ දෙවියන්වහන්සේගේ වගකීම් සම්පූර්ණ කරන පිණිස මගේ මාළිගාව වන ශරීරයට ශක්තිය හා නිරෝගි බව ලැබීම මත පදනම්වූ ආහාර තෝර ගනිමි. මගේ හිසකෙස් නිසි පරිදි පීරා ඇද්දැයි යන්න පිළිබඳව සැලකිලිමත් වනු වෙනුවට මගේ හදවත නිසි පරිදි ඇද්දැයි මම සහතික කර ගනිමි. ක්‍රිස්තුස්වහන්සේගේ ආත්මික සුන්දරත්වය මා තුළ තිබෙන බව අන්‍යයන් දකින්නේදැයි මම විමසිලිමත් වන්නෙමි.

මගේ අනන්‍යතාව ක්‍රිස්තුස්වහන්සේ තුළ නම්, අභ්‍යන්තරයෙන් මා කවුරුන්ද යන වග මගේ ක්‍රියා තුළ දෘෂ්‍යමාන වන්නේය. ආත්මය තුළ වන ජීවිතය මගේ බාහිර පෙනුමෙන් නොව හැසිරීම්වලින් එනම් මගේ ජීවිතයේ ඵලවලින් පෙන්නුම් කරන්නේය. "ආත්මයාණන්වහන්සේගේ ඵල නම් - ප්‍රේමය, ප්‍රීතිය, සමාදානය, ඉවසිලිවන්තකම, කරුණාවන්තකම, යහපත්කම,

නුඹලාගේ ශරීරයන් ජීවමනාවූ" ශුද්ධවූ" දෙවියන්වහන්සේ විසින් පිළිගත හැකිවූ යාගයක් කොට ඔප්පු කරන හැටියට දෙවියන් වහන්සේගේ දයාවන් නිසා නුඹලාගෙන් ඉල්ලමි. එය නුඹලාගේ ආත්මික සේවය වේ (රෝම 12:1)

විශ්වාසකම, මෘදුකම, පමණ දැන ක්‍රියාකිරීම යන මේවාය මෙබඳු දේට විරුද්ධව ව්‍යවස්ථාවක් නැත" (ගලාති 5:22-23).

ආත්මික ඵලය වගා කිරීමට මනස වෙනස්කර ගැනීම අවශ්‍ය වන්නේය. ඊට හේතුව මා සිතන හා විශ්වාස කරන දේ මා ක්‍රියාකරන ආකාරය තීරණය කිරීමය. ඒ අනුව මා වැඩි වශයෙන් වචනය හදාරන විට හා ඒවා ක්‍රියාවට නංවන විට, මම වඩාත් ක්‍රිස්තුස්වහන්සේගේ ස්වරූපයට පරිවර්ථනය වන්නෙමි. මා වැඩි වශයෙන් ක්‍රිස්තුස්වහන්සේ අනුගමනය කිරීමේදී ජීවිතය වඩාත් නිසි දෘෂ්ඨී කෝණයකින් දකින්නෙමි.

ශුද්ධ ලියවිල්ලේ පරස්පර විරෝධී මතය වන්නේ අප ක්‍රිස්තුස්වහන්සේ සමග වඩාත් බැඳී සිටින විට, අප වඩාත් නිදහස භුක්ති විඳින බවය. මෙම පරස්පර විරෝධී මතය විශ්වාස කිරීම සඳහා දෘෂ්ඨී කෝණයේ වෙනස් කිරීමක් අවශ්‍ය වන්නේය. මෙම පරස්පර විරෝධී මතය පවරා ගැනීමට ප්‍රමුඛතාවන් වෙනස් කළ යුතුය. ශුද්ධාත්මයාණන්ගේ ඵල වගා කිරීම සඳහා ක්‍රියා කිරීම අවශ්‍ය වන්නේය. ආත්මිකව වර්ධනය කර ගැනීමට වඩා ශාරිරිකව වෙනස් වීම පහසු බව අප සැමවිටම තහවුරු කර ගන්නෙමු. මගේ චරිතයේ දුර්වල අංශ සොයා ගැනීමට හා වෙනස්වීමට මා ඉදිරියට තල්ලු කිරීමට දෙවියන්වහන්සේට ඉඩ හැරීම සඳහා මගේ අලුත් කොණ්ඩා මෝසතරයක් හෝ රාත්තල් 10 කින් හෝ 15 කින් බර අඩුකර ගැනීමක් හෝ අවශ්‍ය නොවන්නේය.

ඊට පටහැනි ලෙස අලුත් දෘෂ්ඨී කෝණයක් හා අලුත් ප්‍රමුඛතාවන් සැබවින්ම මා නිදහස් කරන්නේය. මා වගා කර ගත යුතු ආත්මික ඵල ලැයිස්තු ගත කරන පාවුල් "මෙබඳු දේට විරුද්ධව ව්‍යවස්ථාවක් නැත" යයි පවසන්නේය. ආත්මික ඵල වර්ධනයට නැඹුරුවන විට මා දාස භාවයෙන් නිදහස කරා රැගෙන යන්නේය.

මෙම නිදහස සොයා ගැනීමට මගේ දෘෂ්ඨී කෝණය මම ලෝකයේ කැඩපතින් වචනයේ කැඩපත වෙත මාරු කළ යුතුය. මම ලෝකයේ කැඩපතින් සුන්දරත්වය සෙවීමට උත්සාය කිරීම මා අසරණ තත්ත්වයට හා පරාජයට පත් කරන්නේය. නමුත් වචනයේ ආකාරයෙන් මා නැතිකර ගැනීම තුළින් මට දැනගත

හැකි මහත්ම සුන්දරත්වය එළිදරව් වන්නේය.

සුන්දරත්වය පිළිබඳ අපගේ දෘෂ්ඨි කෝණය ශුද්ධාත්මයාණන් වහන්සේ වෙනස් කරන කල අන්‍යයන් සමග ඇති අපගේ සම්බන්ධතාව වෙනස් වන්නේය. "තවද ක්‍රිස්තුස් වහන්සේට අයිති තැනැත්තෝ මාංසය එහි ආශා සහ තෘෂ්ණා සමග කුරුසියෙහි ඇණගැසුවෝය. අපි ආත්මයාණන්වහන්සේ කරණකොටගෙන ජීවත්වෙමු නම්, ආත්මයාණන් වහන්සේ කරණකොටගෙන හැසිරෙමු. නිෂ්ඵල පාරට්ටු නොකරමු. එකිනෙකා කෝප නොකරමු. එකිනෙකාට ඊර්ෂ්‍යයා නොවෙමු" (ගලාති 5:24-26).

අපව අන්‍යයන්ට සමකොට ඊර්ෂ්‍යා කරනවාට වඩා දෙවියන්වහන්සේගේ දෑසින් ඔවුන් දෙස බලා ඔවුන්ගේ අද්විතීය දිමනා හා තලෙන්ත පිළිබඳව කෘතඥවීම යහපත්ය.

මා දෙස හා අන්‍යයන් දෙස දෙවියන්වහන්සේගේ දෑසින් බලන කල මගේ ශරීරය ඇතුළු මගේ ජීවිතය විශිෂ්ට දෙවියන්වහන්සේ හට මහිමය හා ගෞරවය ගෙන එන පිණිස මා මවා ඇති අරමුණ සම්පූර්ණ කරන්නාවූ සේවයේ මෙවලමක් වන්නේය.

සුන්දරත්වය දැකීමට භක්තිවන්ත දෘෂ්ඨි කෝණයක් අවශ්‍යය. මගේ නුවණෙහි පිහිටා සිටින්නේ නම්, මට නිවැරදි දෘෂ්ඨි කෝණය නොලැබෙනු ඇත. නුමුත් මුළු භූමි තලයම දරා සිටින්නාවූ තැනැන්වහන්සේ කෙරෙහි මා විශ්වාසය තබන විට, "ඒ වැස්ම අහක්කරනු ලැබේ. ඉදින් ඒ ස්වාමින්වහන්සේ ආත්මයාණන්වහන්සේය. ස්වාමින්වහන්සේගේ ආත්මයාණන්වහන්සේ ඇති තැන නිදහස්කම ඇත්තේය. අපි සියල්ලෝද මුහුණු වැස්මක් නැතුව, ස්වාමින්වහන්සේගේ තේජස කැඩපතකින් මෙන් දක්වමින් ආත්මයාණන්වහන්සේ වන ස්වාමින්වහන්සේ කෙරෙන් තේජසින් තේජසට එම ස්වරූපයට වෙන් කරනු ලබමුව" (2 කොරින්ති 3:16-18). මම උන්වහන්සේට වඩා සමීපවන විට මගේ දෘෂ්ඨි කෝණය වඩාත් නිවැරදි වන්නේය.

Discovery Series®

## බයිබලයේ ජීවිත වෙනස් කරන්නාවූ ප්‍රඥාව සියලු දෙනා හට තේරුම් ගැන්වීම හා ඊට සමීපවීමට සැලැස්වීම අපගේ මෙහෙවරයි.

ඩිස්කවරි දැනුම පොත් පෙල, යේසුස් ක්‍රිස්තුස්වහන්සේ පිළිබඳව සත්‍යයන් සමබරවත්, සිත් ගන්නා සුළු අකාරයටත් සහ සැමට ලබා ගත හැකි ආකාරයටත් ජීවිතයේ සෑම පැතිකඩකටම දේව වචනය අදාලවන ආකාරය ඉදිරිපත් කරයි.

දේව වචනය බෙදාහැරීම තුළ අප සමඟ හවුල් වීමට, පරිත්‍යාග සඳහා පහත ලින්ක් එක ඔබන්න. අපගේ දිනපතා භෝජනය සේවයට සහ ඩිස්කවරි දැනුම පොත් පෙල වෙත ඔබ දක්වන්නාවූ සහයෝගයට ස්තූති.

කිසිදු කණ්ඩායමකින් හෝ නිකායකින් අරමුදල් සැපයෙන්නේ නැති නමුත් ඉතා කුඩා ප්‍රමාණයකින් හෝ උපකාර කරන බොහෝ පරිත්‍යාගශීලීන් නිසා බයිබලයේ ජීවිත වෙනස් කරවන ප්‍රඥාව තවත් අය වෙත රැගෙන යාමට අපගේ දිනපතා භෝජනය සේවයට හැකිවී තිබේ.

පරිත්‍යාග

දේව වචනය අධ්‍යයනය කිරීමේ සිට දෙවියන්වහන්සේ දැන ගැනීම, කිතුනු ජීවිතය, වත්මන් ගැටළු, සම්බන්ධතා සහ දුෂ්කර අවස්ථාවන්හිදී උපකාර දක්වා වූ මාතෘකාවන් විශාල ප්‍රමාණයක් පිළිබඳව බයිබලය පදනම් කරගෙන ලියැවුණු පොත් මාළාවක් ඩිස්කවරි දැනුම පොත් පෙළ ලබා දෙයි.

මෙම පොත් පිංච, බයිබලීය ප්‍රඥාව, බලාපොරොත්තුවේ පණිවිඩ සහ බැතිමත් උපදේශනයන් තුළින් ඔබ ක්‍රිස්තුස්වහන්සේ සමඟ යන ගමන තුළ ආත්මික වර්ධනය ලබා දෙනු ඇත. මෙය පුද්ගලික හෝ කණ්ඩායම් අධ්‍යයනයන් සඳහා යෝග්‍යය.

For information on our resources, please write to the office nearest you from the list below, or go to **ourdailybread.org/locations** for the complete list of offices.


**Singapore**: Our Daily Bread Ministries Asia Ltd, 5 Pereira Road #07-01 Asiawide Industrial Building, Singapore 368025

**Sri Lanka**: Our Daily Bread Ministries, No 64/1 Galle Road, Dehiwala 10350

**USA**: Our Daily Bread Ministries, PO Box 2222, Grand Rapids, MI 49501-2222, USA



ඉතා කුඩා ප්‍රමාණයකින් හෝ උපකාර කරන බොහෝ පරිත්‍යාගශීලී පාඨකයින් නිසා බයිබලයේ ජීවිත වෙනස් කරවන ප්‍රඥාව තවත් අය වෙත රැගෙන යාමට අවර් ඩේලි බ්‍රෙඩ් මිනිස්ට්‍රීස් හට හැකිවී තිබේ. කිසිදු කණ්ඩායමකින් හෝ නිකායකින් අප වෙත අරමුදල් සැපයෙන්නේ නැත.


**ourdailybread.org** | **sinhala-odb.org**

Our Daily Bread Ministries®

NU931